15

# සාම්ප්‍රදායික යෙදුම්

අදහස් ප්‍රකාශ කිරීමේ ප්‍රධාන මෙවලමක් ලෙස භාෂාව හඳුනා ගත හැකි වේ. එම භාෂාව සතු වූ විශේෂ උපාංග මගින් භාෂාවෙන් සිදුවන සන්නිවේදන කාර්යය වඩාත් ඵලදායි සහ අර්ථවත් කර ගත හැකි ය. භාෂාව සතු මෙම උපාංග අතර එක් අංගයක් ලෙස සාම්ප්‍රදායික යෙදුම් හඳුන්වා දීමට පුළුවන. එම සාම්ප්‍රදායික යෙදුම් අතර රූඪී හෙවත් ඉඟිවැකි, ප්‍රස්තාව පිරුළු, ආප්තෝපදේශ, යුගල පද පිළිබඳ හැඳින්වීමක් මෙහිදී සිදු කෙරෙයි.

## ඉඟි වැකි හෙවත් රූඪී

<u>සත්‍යපාල මට්ටු වුණා</u>

**උපාසක බළලා** වගේ හිටියට සත්‍යපාල **ඇඳ බාන්නෙම** බේගල්. දවසක් මිනිහ කියපු කතාවකට අප්පුහාමි මාමාට **අසූහාරදාහට නැගලා** පහුවදා **කුකුළා** අතින් අරගෙන ආපු අප්පුහාමි සත්‍යපාලට හොඳට ම **දෙහි කැපුවා.** එතන හිටපු හේතුහාමි **හීන්නූල් කාරයා.** මිනිහ **කරබාගෙන** එතැනින් **ලිස්සලා ගියේ** ඒ හබයට **හොට දැම්මොත්** තමන්ගෙ **සායම යන** බව **සක්සුදක් සේ** දැනගත්ත නිසා. සත්‍යපාලත් එක්ක **දිවෙන් දිව ගාගෙන** හිටපු හේතුහාමි **සුටුස් ගාලා** මාරු වුණේ අප්පුහාමි **ලෙල්ලට කටුවට** නැති මිනිහ බව **සහසුද්දෙන්** දන්න හින්ද. ඒ වුණාට මොකද සත්‍යපාලයි අප්පුහාමියි **එක ඉත්තෙ පොල්.** හැබැයි සත්‍යපාල එතන තනිවුණා. මිනිහ හිතාගත්තා අප්පුහාමි නම් **එකට කතත් බොක්ක වෙනස්** අදින් පස්සෙ **අම්මෙ මුත්තෙ කීවත්** ඌ එක්ක ඇයි **හොඳයියක්** ඕනැ නෑ කියල. දැන් ඉතින් සත්‍යපාලට **උල්පන්දම් දෙන්න** කෙනෙක් නෑ. ඒ හින්ද මිනිහ **කට පරිස්සම් කරගෙන පාඩුවෙ ඉන්න** හිතාගත්තෙ ඒක ඇඟට **ගුණයි** කියල.

ඉහත කතාවේ අංකිත ප්‍රකාශ පිළිබඳ අවධානය යොමු කරන්න. ඒවායේ වචනාර්ථය ඉක්මවා ගිය සැඟවුණු අරුතක් ඇති බව ඔබට පැහැදිලි වනු ඇත.

> මෙසේ වචනාර්ථය ඉක්මවා යමින් සැඟවුණු අරුතක් ප්‍රකාශ කරන අර්ථය ඉඟියෙන් ගත හැකි යෙදුම් ඉඟි වැකි ලෙස හඳුන්වා දිය හැකි ය. රූඪී යනු ද ඉඟිවැකිවලට යෙදෙන පර්යාය පදයකි.

ව්‍යවහාරයේ දී බොහෝ සේ හමුවෙන ඉඟිවැකි පහත දැක්වේ.

| | ඉඟි වැකි | ඉන් පැවසෙන අර්ථය |
|---|---|---|
| 1 | ගල්පැලෙන බොරු | බරපතල අසත්‍යයක් |
| 2 | මූණේ දැලි ගෑවා | නින්දා ගෙන දීම |
| 3 | උපාසක බළලා | සුදන වෙස් ගත් දුදන අය |
| 4 | අනූනවයෙන් බේරුණා | යන්තමින් අනතුරකින් බේරීම |
| 5 | කජු කන්නා වාගේ | යමක් ඉතා පහසුවෙන් ඉටු කිරීම |
| 6 | කළු කඩ කාරයා | අයුතු ලාභ ලබන්නා |
| 7 | සායම ගියා | කීර්තිය නැති වී යාම |
| 8 | උල්පන්දම් දෙනවා | රහසින් අනුබල දීම |
| 9 | කුකුළු නින්ද | ඉතා කෙටි නින්ද |
| 10 | දිවෙන් දිව ගාගෙන | දැඩි මිතුරු බැවින් |
| 11 | කිඹුල් කඳුළු හෙළනවා | බොරුවට කණගාටු වීම |

| | | |
|---|---|---|
| 12 | ළිඳේ ඉන්න ගෙම්බා | අවට ලෝකය ගැන නොදන්නා තැනැත්තා |
| 13 | හෙම්බත් වුණා | අධික වෙහෙසට පත් වුණා |
| 14 | රජගෙදර පරවියා | අධික සැප සම්පත් විඳින්නා |
| 15 | ගොළුබෙලි ගමන | ඉතා සෙමෙන් ගමන |
| 16 | අකුල් හෙළනවා | බාධා කරනවා |
| 17 | ඉහේ මලක් පිපුණා | අධික ලෙස සතුටු වීම |
| 18 | හණ මිටි කාරයා | පරණ අදහස් දරන්නා |
| 19 | ඔළුව ඉදිමිලා | ආඩම්බර වීම |
| 20 | අවසන් නින්ද | සදහටම නෙත් පියා ගැනීම |
| 21 | පොර කුකුළා | නිතර සටනට එන්නා |
| 22 | ගැටයට අහුවුණා | උපායට හසු වීම |
| 23 | හමස් පෙට්ටියට දමනවා | යමක් ක්‍රියාත්මක නොකරන තැනට පත් කිරීම |
| 24 | කරල පැහිලා | අතමිට සරුවෙලා |
| 25 | දූපනෙ දා ගන්නවා | වසඟ කර ගන්නවා |

මේ අතර එක ම පදයක් විවිධාර්ථවත්ව යෙදෙන අවස්ථා ඇත.

| | **ඉඟි වැකිය** | **ඉන් පැවසෙන අර්ථය** |
|---|---|---|
| 26 | අං අදිනවා | එකඟතාවකට පත් නොවීම |
| 27 | අං හරස් කරනවා | බාධා කිරීම |
| 28 | අං ඇවිල්ලා | උඩගු වීම |
| 29 | අං මතුවීම | මෝඩකම මතුවීම |
| 30 | අං ගිලීම | අධික කපටිකම |
| 31 | අං මැදීම | රණ්ඩුවකට සූදානම් වීම |
| 32 | මූණ ඇඹුල්වුණා | අසතුටට පත් වීම / අපහසුතාවකට පත් වීම |
| 33 | මූණ රතුවුණා | ලැජ්ජාවට පත් වීම |
| 34 | මූණෙ දූලිගෑව | කීර්තිය නැති කිරීම |
| 35 | මූණ පිම්බීම | නොරිස්සන ස්වභාවයෙන් සිටීම |
| 36 | මූණට කිව්වා | ඍජුවම ප්‍රකාශ කිරීම |
| 37 | මූණ හැංගුවා | පසු බැස්සා |

## ක්‍රියාකාරකම 1

**පහත දැක්වෙන ඉඟිවැකිවල අර්ථය ප්‍රකාශ කරන්න.**

| ඉඟිවැකිය | අර්ථය |
|---|---|
| 1. ඇගේ මාළු නටනවා | ............................................................................ |
| 2. ලෑල්ලට පාගනවා | ............................................................................ |
| 3. දෙහි කපනවා | ............................................................................ |
| 4. කණ කොකා හැඬීම | ............................................................................ |
| 5. පොත් ගුල්ලා | ............................................................................ |
| 6. නරි අං සෙවීම | ............................................................................ |
| 7. පොර කුකුළා | ............................................................................ |
| 8. අත දෙනවා | ............................................................................ |
| 9. අඹ යාළුවා | ............................................................................ |
| 10. කුණු කොල්ලෙට | ............................................................................ |

## ක්‍රියාකාරකම 2

**පහත දැක්වෙන ඉඟිවැකි අර්ථය පැහැදිලි වන සේ වාක්‍යවල යොදන්න.**

1. මුදුන් පෙත්තට ම
2. ඉස්පිල්ලක් පාපිල්ලක් නැර
3. පදයක් හදනවා
4. වහ කදුරු
5. කෝපි කාලෙ
6. ඇඟිලි ගහනවා
7. යල් පැන ගිය
8. බේගල් ඇදබානවා
9. මූණ රතුවුණා
10. හෙනහුරා ලබලා

## II ප්‍රස්තාව පිරුළු

පහත දැක්වෙන්නේ ශ්‍රී දන්තසාර ධර්මායතන පිරිවෙණේ දිනපතා පවත්වනු ලබන සමාරම්භක රැස්වීම අවසන් කරමින් පරිවේණාධිපති හිමියන් කළ දේශනයේ අවසන් කොටසයි.

"ඉතින් ඔය ළමයිනු යි පොඩි හාමුදුරුවරු යි හොඳින් හිතට ගන්න ඕනෑ <u>ලෙඩ කපුටො වැල කනව වගේ</u> නැතිව මේ අවසාන වාරයේ හොඳින් හිතට අරගෙන, උනන්දුවෙන් වැඩ කළොත් ලබන අවුරුද්දෙ අලුත් පන්තියකට යන්න පුළුවන්. හොඳ උත්සාහයකින් උනන්දුවකින් ඉගෙනීමේ කටයුතු කළොත් හැම දෙනාට ම ජීවිතය ජය ගන්න පුළුවන්. ඒක හරියට <u>කිරි ගහට ඇන්න වගේ</u> තමයි. ආයෙ දෙකක් නැහැ."

රැස්වීම අවසන් වී පන්තියට ගිය බෝඹුවල අරියසීල පොඩි හාමුදුරුවො පන්ති භාර ගුරු හිමියන්ගෙන් මෙසේ ඇසූහ.

**අරියසීල හිමි :** මොකක්ද අපේ හාමුදුරුවනේ අර නායක හාමුදුරුවෝ "**ලෙඩ කපුටො වැල කනවා වගේ**" කිව්වෙ?

**පන්ති භාර ගුරු ස්වාමින් වහන්සේ :**
බොහොම හොඳ ප්‍රශ්නයක් පොඩි හාමුදුරුවො ඇසුවෙ. අද සිංහල පාඩමත් ප්‍රස්තාව පිරුළුවලට අදාළවනෙ.භාෂාවක රසය වැඩි කරන්න, අර්ථ තේරුම් කර දීමට, තැනට ගැළපෙන ආකාරයෙන් පවසන ප්‍රකාශ තිබෙනවා. එබඳු යෙදුම් හඳුන්වන්නේ ප්‍රස්තාව පිරුළු ලෙස යි. මුලින් නායක ස්වාමීන් වහන්සේ පැවසූ **ලෙඩ කපුටො වැල කනවා වගේ** කියූ ප්‍රකාශය එබඳු ප්‍රස්තාව පිරුළක් ලෙස හඳුන්වන්න පුළුවන්. ඉන් අදහස් කළේ කිසිදු ඕනෑකමක් නැතිව වැඩ කරනා බව යි. මෙබඳු ප්‍රකාශ රාශියක් භාෂාව සතුව පවතිනවා. අරියසීල පොඩි හාමුදුරුවන්ට එය පැහැදිලි වී ඇතැයි සිතනවා.

**අරියසීල හිමි** : එහෙමයි ලොකු හාමුදුරුවනේ මට දැන් ඉතා හොඳට පැහැදිලි වුණා. ප්‍රස්තාව පිරුළුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මත ඒවා වර්ග කළ හැකි ය.

**● කතන්දර ආශ්‍රයෙන් ඇති වූ පිරුළු**

1. අන්දරේ සීනි කෑවා වගේ
2. අන්ධයන් ඇතාගේ හැටි කීවා වගේ
3. අබරා සිල් ගත්තා වගෙයි
4. ආඬි හත් දෙනාගේ කැඳ හැළිය වගේ
5. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගේ
6. කැකිල්ලේ රජ්ජුරුවන්ගේ නඩු තීන්දුව වගේ
7. ගමරාල දෙව්ලොව ගියා වගේ
8. බල්ලාගේ වැඩේ බූරුවා කරා වගේ
9. කළුවා මාරපන් ගියා වගේ
10. වක්කඩේ හකුරු හැංගුවා වගේ

**● කිසියම් සත්‍යයක් පදනම් කරගත් පිරුළු**

1. අත්තෙන් අත්තට පනින කුරුල්ලා තෙමී නසී
2. කීවොත් සඟ නසී නොකීවොත් වෙහෙර නසී
3. අඬනකොටලු කිරි එරෙන්නෙ
4. ගහේ කටු උල් කරන්න ඕනැ නැහැ
5. ගලේ කෙටූ අකුරු වගෙයි
6. බුරන බල්ලෝ හපා නොකති

**● උපමා අර්ථයේ පිරුළු**

1. මඩේ සිට වූ ඉන්න වගේ
2. මිටිකිරි විසිකර දිය කිරි ගත්තා වගේ
3. ආචාරියා රවටා කැත්ත හැදුවා වගේ
4. අතරමගදි අත්වැල කැඩුණා වගේ
5. ඉත්තෑවගෙ ගෙට කබල්ලෑවා රිංගුවා වගේ
6. මුහුද හත්ගව්වක් තිබිය දී අමුඩ ගහනව වගේ
7. කොටිවලිගෙ අල්ලා ගත්තා වගේ

- **ශ්‍රැති සූචනාර්ථයේ ල, ලු නිපාත සහිත පිරුළු**

1. ගහට ගහක් මොරටුවේදී හමුවෙනවා ලු
2. බත් ඇතිදාට කොස් තිත්ත ලු
3. ගියලුලා මහ එකා ලු
4. එකට කතත් බොක්ක වෙනස් ලූ

## ක්‍රියාකාරකම 3

**පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලට සුදුසු අර්ථ සපයන්න.**

1. ඉබ්බාගෙන් පිහාටු ඉල්ලුවා වගේ.

   ............................................................

2. ඉඳිකටු තුඬේ තපස් රැක්කා වගේ.

   ............................................................

3. හැට පිරුණත් වඳුරා බිම ගමන් නැත.

   ............................................................

4. ඇවිළෙන ගින්නට පිදුරු දැම්මා වගේ.

   ............................................................

5. පුහුල් හොරා කරෙන් දැනේ.

   ............................................................

6. ආතාට අටුකොස් දුන්නා වගේ.

   ............................................................

7. ඇඟෙන් ඇටයක් ගියා වගේ.

   ............................................................

8. කණා කිරේ පාට කිව්වා වගේ.

   ............................................................

9. කතාව දෝලාවෙන් ගමන පයින්.

   ............................................................

10. කබල් රෝදෙ සද්දෙ වැඩියි.

    ............................................................

## ක්‍රියාකාරකම 4

**(අ) කොටසේ ඇති ප්‍රස්තාව පිරුළුවලට ගැළපෙන අර්ථ (ආ) කොටසෙන් සොයා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| 1. ලූලා නැති වළට කණයා පණ්ඩිතයා | අවශ්‍ය වෙලාවට නැති දේවලින් පසු ව වැඩක් නැත. |
| 2. හිත ඇත්නම් පත කුඩා ද? | නිෂ්ප්‍රයෝජන ක්‍රියාවක් කිරීම. |
| 3. උඩින් මිතුරු යටින් හතුරු | උත්සහවන්තයාට කළ නොහැක්කක් නැත. |
| 4. පුස්ස බින්දා වගෙයි | සුදුස්සකු නැති තැන නුසුදුස්සා ඉස්මතු වීම. |
| 5. දත් නැති දා උක් දඬු ගිනි තපින්න ද? | හිතවත් කම පෙන්වා ද්‍රෝහි වීම. |

## ආප්තෝපදේශ

සාම්ප්‍රදායික යෙදුම් අතර වෙන් කොට හඳුනා ගත හැකි තවත් විශේෂ යෙදුම් වර්ගයක් තිබේ. ආප්තෝපදේශ ලෙස නම් කරන්නේ ඒවා යි. ආප්තෝපදේශයක, ආවේණික ලක්ෂණ

- එමගින් කිසියම් උපදේශයක් සපයයි.
- පඬිවරුන් උගතුන් අනුදත් නිගමන එම යෙදුම්වල අන්තර්ගත වේ.
- ආප්තෝපදේශ ප්‍රස්තාව පිරුළුවලට වඩා කෙටි ය.

එබඳු ආප්තෝපදේශ කීපයක් මෙසේය.

**නිදසුන් :**

1. පිරුණු කළේ දිය නොසැලේ
2. උඩ පැන්නොත් බිම වැටෙයි
3. පනින්ට පෙර සිතා බලනු
4. පෙරළෙන ගලේ පාසි නොබැඳේ
5. දිළිසෙන සියල්ල රත්තරං නොවේ

ප්‍රස්තාව පිරුළුවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මත ඒවා වර්ග කළ හැකි ය.

## III යුගල පද

"<u>උගත් නූගත්කම</u> නොතකා සමාජයේ වෙසෙන <u>කොයි කවුරුත් හොඳ නරක</u> හඳුනාගෙන ජීවත් වීම වටී"

ඉහත ප්‍රකාශයේ **'උගත් නූගත්'**, **'කොයි කවුරුත්'**, **'හොඳ නරක'** යන යෙදුම්වල පද යුගල වී ඇත්තේ භාෂාවට අලංකාරයක් ගෙන දීමට සමත් වන පරිද්දෙනි.

සන්නිවේදන කාර්යයේ කාර්යක්ෂමතාව උදෙසා භාවිත කෙරෙන භාෂා උපාංග අතර යුක්තාර්ථවත් පද දෙකක් එකිනෙක ගළපා ජීවයෙන් යුතු ව සංග්‍රහවීම යුගල පදයකි. සෑම යුගල පදයක් ම දකාරාර්ථ සමාස පදයක් ද වේ.

සිංහල භාෂාවේ මෙබඳු යුගල පද සෑදෙන රටා සමුදායකි. එම පද යුගලයේ ස්වභාවය අනුව ප්‍රභේදය තීරණය වේ.

- **පූර්ව ක්‍රියා පද සංග්‍රහය**

සොයා - බලා
කා - බී
කවා - පොවා
ගයා - වයා

- **අනුප්‍රාසාත්මක පද සංග්‍රහය (මේවායේ ඇතැම්විට එක පදයක පමණක් අර්ථය තිබෙන අතර අනෙක් පදය අනුප්‍රාසාත්මතකව යෙදේ.)**

අඟර - දඟර
නහින - දෙහින
ළමයි - බමයි
අහළ - පහළ

- **විරුද්ධාර්ථ පද සංග්‍රහය**

පින් - පව්
හොඳ - නොහොඳ
දුක - සැප
අඩු - වැඩි
ඇති - නැති

- **සමීපාර්ථවත් පද සංග්‍රහය**

වතු - පිටි
හරක - බාන
නඩු - හබ
ඉඳුම් - හිටුම්

- **පද දෙක ම අර්ථ රහිත යුගල පද සංග්‍රහය (පද යෙදෙන පරිසරය අනුව අර්ථය තීරණය වේ.)**

ලට්ට - ලොට්ට
අනං - මනං
වං - හුං
කඩි - මුඩි
අස් - පස්

- **සමානාර්ථ යුගල පද සංග්‍රහය**

රට - රාජ්‍ය
සමිති - සමාගම්
යාන - වාහන
ඉඳුම් - හිටුම්

- **සංඛ්‍යාර්ථ පද සංග්‍රහය**

සිය - දහස්
ශත - සහස්‍ර
කෝටි - ප්‍රකෝටි
හැට - හැත්තෑ

- **ඥාති නාම සංග්‍රහය**

නැන්ද - මාමා
නෑනා - මස්සිනා
අත්ත - මුත්ත
අයිය - මලෝ

- **සත්ත්ව නාම සංග්‍රහය**

බලු - කපුටු
ඇත් - අස්
අලි - කොටි
වග - වලස්

## ක්‍රියාකාරකම 5

- පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

1. අතුරු ..................................
2. ඇහැ ..................................
3. අරුම ..................................
4. ඇඟ ..................................
5. ඉඟි ..................................
6. උස් ..................................
7. කඩ ..................................
8. ගේ ..................................
9. කී ..................................
10. ඕක ..................................

## ක්‍රියාකාරකම 6

- පහත දැක්වෙන යුගල පද එහි විශේෂ අර්ථ සලකා වර්ග කරන්න.

1. කුඩ - බුඩ
2. කැවිලි - පෙවිලි
3. කොට්ට - මෙට්ට
4. ගුණ - දොස්
5. ගරු - සරු
6. කල - දවස
7. කාලා - බීලා
8. එහෙන් - මෙහෙන්
9. අග - මුල
10. අඬා - දොඬා

iqNdIs;

**මනස්වී මෘයතෙ කාමං**
**කාපීණ්‍යංතු නගච්ඡති**

උසස් සිතක් ඇති තැනැත්තා මිය යතත් බැගෑ බවට නොයයි.

iqÑka;k

ඔබට යමක් වෙනස් කිරීමට අවශ්‍ය නම් මුලින් ම ඔබ වෙනස් විය යුතු ය.

# 16

# සාහිත්‍ය රසාස්වාදය හා විචාරය

විධිමත් වූ වර්ණ සංයෝජනයෙන් අලංකාර වූ සිතුවමක් නෙත් සිත්හි චමත්කාරයක් ඇතිකරලීමෙහි සමත් වෙයි. එසේ ම භාෂාව, විචිත්‍ර ලෙසත් අපූරු ලෙසත් ගැළපීමෙන් උපදින සාහිත්‍යය, මිනිසාගේ සිත් සතන්හි උපදනා ශෝකය සන්සිඳුවා ගන්නටත්, විවේකය විනෝදවත් කර ගන්නටත්, සිත සන්සුන් කර ගන්නටත් කරුණාව මෛත්‍රිය වැනි උසස් චින්තනයන් කරා ගමන් කරන්නටත් ඉවහල් වේ.

සිතුවමකින් මතු වන සැබෑ රසයත් හරයත් මතු කර ගන්නට නම් එය මනා ව පරිශීලනය කළ යුතු ව ඇත. ඊට අදාළ ක්‍රමවේද දැන සිටීම විශේෂිත ය. සාහිත්‍යයෙන් මතුවන රසය හා හරය උකහා ගන්නට හැකි වන්නේ ද එය මනා ව පරිශීලනයට අවශ්‍ය ක්‍රමවේද දැන සිටීමෙනි. සාහිත්‍ය රසාස්වාදය හා විචාරය යන මැයෙන් සිදු කෙරෙන්නේ සාහිත්‍ය පරිශීලනයට අදාළ ක්‍රමවේද සොයා යාම යි.